සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## අවසාන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2023
## Third Term Test - Grade 08 - 2023

## භූගෝල විද්‍යාව

කාලය පැය 02 යි

නම / විභාග අංකය:

- I කොටසේ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න.
- II කොටසේ ''අ'' කොටසට ද පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න.

### I කොටස

- ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුර අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. පෘථිවියට වඩාත් ආසන්නවම පිහිටි තාරකාව .............................................. වේ.

(බුධ / සූර්යයා / Planet 9)

02. ග්‍රහලෝක වටා කක්ෂගතව පරිභ්‍රමණය වන කුඩා පරිවාර ග්‍රහලෝක ........................................... ලෙස හැඳින්වේ.

(වාමන ග්‍රහලෝක / ග්‍රහ අංශු / උප ග්‍රහයින්)

03. සෞරග්‍රහ මණ්ඩලයේ ග්‍රහලෝක අතරින් වැඩිම උෂ්ණත්වයකින් යුක්ත ග්‍රහලෝකය .............................. වේ.

(සිකුරු / පෘථිවිය / බුධ)

04. බංග්ලාදේශයේ සුන්දරබාන් වගුරුබිම ආශ්‍රිතව ප්‍රධාන වශයෙන් ......................... වගා කරයි.

(මිලට් / ජූට් / වී)

05. ශ්‍රී ලංකාව 1:50,000 සිතියම් කොටස් ................................. කින් සමන්විත වේ.

(94 / 96 / 92)

- ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවල දී ඇති ප්‍රකාශ කියවා බලා නිවැරදි නම් (✓) ලකුණද, වැරදි නම් (×) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

06. හිමාල කඳුකරයෙන් ආරම්භ වන ගංගා නම් ගඟ 2610km පමණ දුර ගෙවා බෙංගාල බොක්කට ගලා බසී. (............)

07. පෘථිවියේ සමක විශ්කම්භයට වඩා ධ්‍රැවක විශ්කම්භය වැඩිය. (............)

08. බාහිර ග්‍රහලෝක වායුමය සංයුතියකින් යුක්ත වේ. (............)

09. ග්‍රාමීය භූ දර්ශනයේ කාර්මික කටයුතු, ආර්ථික කටයුතු අතර ප්‍රධාන වේ. (............)

10. පොළෝතලයේ ඇති විවිධ ලක්ෂණ සිතියමක් මගින් නිරූපණය කළ හැකිය. (............)

- අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවල දී ඇති පිළිතුරු අතරින් නිවැරදි හෝ වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

11. ප්‍රධාන වායුව $CO_2$ වන ග්‍රහලෝකය කුමක් ද?
    1. බුධ  2. සිකුරු  3. සෙනසුරු  4. අඟහරු

12. සෞරග්‍රහ මණ්ඩලයේ ග්‍රහක වළල්ල පිහිටා ඇත්තේ කුමන ග්‍රහලෝක අතර ද?
    1. අඟහරු ග්‍රහයා සහ සෙනසුරු ග්‍රහයා අතර  2. බ්‍රහස්පති ග්‍රහයා සහ සෙනසුරු ග්‍රහයා අතර
    3. සිකුරු ග්‍රහයා සහ අඟහරු ග්‍රහයා අතර  4. අඟහරු ග්‍රහයා සහ බ්‍රහස්පති ග්‍රහයා අතර

13. සූර්යයා පිළිබඳ වැරදි ප්‍රකාශය තෝරන්න.
    1. සූර්යයාගේ මතුපිට සූර්යය කුණාටු ඇතිවේ.
    2. සෞරග්‍රහ මණ්ඩලයේ මුළු ස්කන්ධයෙන් 99.86% අයත්වේ.
    3. සූර්යයාගේ මධ්‍යයේ උෂ්ණත්වය $60000^0C$ පමණ වේ.
    4. සූර්යයා තම අක්ෂය වටා භ්‍රමණය වේ.

14. දකුණු ආසියාවට අයත් නොවන දූපතක් වන්නේ
    1. සීෂෙල් දූපත්  2. මාලදිවයින් දූපත්  3. අන්දමන් දූපත්  4. නිකොබාර් දූපත්

15. ගංගා නම් ගංගා නිම්න භූ දර්ශනය පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
    1. ප්‍රධාන ආර්ථික කටයුත්ත ධීවර කර්මාන්තයයි.
    2. නොදියුණු ගෝත්‍රික ජනයා වාසය කරයි.
    3. තැනිතලා ප්‍රදේශයකි.
    4. ඉහළ ගංගා නිම්නයේ සිට පහළට යන විට විවිධ භෝග වගා කරයි.

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර හිස්තැන මත ලියන්න.**

16. හිමාලය කඳුකර භූ දර්ශනය තුළ හිම මිදුන ප්‍රදේශ මෙන්ම නේපාලයේ ...................................... නිම්නයේ උණුසුම් දේශගුණික ලක්ෂණ ද දැකගත හැකිය.

17. ඉහළ වායුගෝලයේ ඇති .................................................... වායු ස්තරය මගින් සූර්යය විකිරණයේ ඇති අහිතකර කිරණ පෘථිවියට ඒම පාලනය කරයි.

18. හිමාලය කඳුකරයේ ......................................... ජන වර්ගයට අයත් ගෝත්‍රික ජනයා ජීවත් වේ.


19. මාලදිවයින් දූපත් කොරල්පර සහ .............................................. වලින් සෑදී දූපත් 1200කට වැඩි සංඛ්‍යාවකින් සමන්විත වේ.

20. පෘථිවිය සූර්යයා වටා ගමන් කරන මාර්ගය ..................................................................... ලෙස හැඳින්වේ.

## II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.

01. (අ) පිළිතුරු සැපයීම සඳහා පහත දැක්වෙන සිතියම උපයෝගී කරගන්න. (ලකුණු 08)




i. සිතියමෙහි මීටර 20 අන්තරයට ඉතිරි සමෝච්ඡ රේඛා වටිනාකම් දක්වන්න.

ii. මීටර් 160ට වඩා වැඩි උස්බිම් ප්‍රදේශ දුඹුරු පාටින් සේයා කරන්න.

iii. සිතියමේ දක්වා ඇති මාර්ගය නිවැරදි වර්ණයෙන් ඇඳ දක්වන්න.


iv. මාර්ගය හා කඳු වැටිය අතරින් පළාත් මායිමක් ඇඳ දක්වන්න.

v. මාර්ගයට ආසන්නව මාර්ගයේ දකුණු පසින් දුම්රිය මාර්ගයක් ඇඳ දක්වන්න.

vi. සිතියමේ අක්ෂර මගින් දක්වා ඇති භූ ලක්ෂණ නම් කරන්න.

(a) A - B (b) C - D (c) E - F

(ආ) දකුණු ආසියානු කලාපය දැක්වෙන සිතියම ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. (ලකුණු 08)




i. A අක්ෂරයෙන් දැක්වෙන කඳුවැටිය නම් කරන්න.

ii. B අක්ෂරයෙන් දැක්වෙන ගංගාව කුමක්ද?

iii. C අක්ෂරයෙන් දැක්වෙන අගනුවර නම් කරන්න.

iv. D අක්ෂරයෙන් දැක්වෙන කාන්තාරය නම් කරන්න.

v. E අක්ෂරයෙන් දැක්වෙන ඉන්දියාවේ පිහිටි තුඩුව නම් කරන්න.


vi. අරාබි මුහුද දැක්වෙන අක්ෂරය ලියන්න.

vii. බෙංගාල බොක්ක දැක්වෙන අක්ෂරය කුමක්ද?

viii. ඉන්දියන් සාගරය දැක්වෙන අක්ෂරය කුමක්ද?


02. i. තාරකා සහ ග්‍රහලෝක අතර වෙනස්කම් දෙකක් ලියන්න. (ලකුණු 02)

ii. පහත A, B, C, D, වලින් දැක්වෙන ග්‍රහ වස්තූන් හැඳිනගෙන නම් කරන්න. (ලකුණු 04)


A


B


C


D

iii. සෞරග්‍රහ මණ්ඩලයේ දැනුම භාවිතකොට නිවැරදි පිළිතුර සපයන්න. (ලකුණු 05)

(a) රතු ග්‍රහයා ලෙස හඳුන්වන ග්‍රහලෝකය කුමක් දැයි නම් කරන්න.

(b) අධික ශීතලකින් යුක්ත ග්‍රහලෝකය කුමක් දැයි නම් කරන්න.

(c) සෞරග්‍රහ මණ්ඩලයේ කුඩාම ග්‍රහලෝකය කුමක් දැයි නම් කරන්න.

(d) අධිකතම ගුරුත්වාකර්ෂණ බලයක් ඇති ග්‍රහලෝකය කුමක් දැයි නම් කරන්න.

(e) වායුගෝලයක් නොමැති ග්‍රහලෝකය කුමක් දැයි නම් කරන්න.

03. i. පෘථිවි භ්‍රමණය යනු කුමක් ද? (ලකුණු 02)

ii. (a) පෘථිවිය අක්ෂාංශ 01ක් භ්‍රමණය වීමට ගතවන කාලය කොපමණ ද?

(b) පෘථිවි භ්‍රමණය නිසා ඇතිවන ප්‍රතිඵල දෙකක් ලියන්න. (ලකුණු 03)

iii. ග්‍රිනිච් මධ්‍යහන රේඛාවේ (දේශාංශ $0^0$) වේලාව පෙ.ව. 11.15 සේ සලකා පහත සඳහන් අක්ෂාංශවල පිහිටි නගරවල වේලාව ගණනය කරන්න. (ලකුණු 06)

(a) බටහිර දේශාංශ $100^0$ පිහිටි මෙක්සිකෝසිටි

(b) නැගෙනහිර දේශාංශ $140^0$ පිහිටි ටෝකියෝ

(c) නැගෙනහිර දේශාංශ $104^0$ පිහිටි සිංගප්පූරුව

04. i. පෘථිවිය සුවිශේෂී ග්‍රහලෝකයක් ලෙස හැඳින්වීමට හේතුවන සාධක දෙකක් ලියන්න. (ලකුණු 02)

ii. පෘථිවි පරිභ්‍රමණය ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න. (ලකුණු 04)

| දිනය | හඳුන්වන ආකාරය |
|---|---|
| මාර්තු 21 | i. .................................. |
| ii. .................................... | ගිම්හාන නිවෘත්තිය |
| iii. .................................... | සරත් විෂුවය |
| දෙසැම්බර් 22 | iv. .................................... |

iii. (a) ලෝකයේ ප්‍රාදේශීය වශයෙන් සම්මත වේලාවන් කිහිපයක් භාවිත වන රටවල් දෙකක් ලියන්න.

(b) පහත සඳහන් අක්ෂාංශ රේඛා හඳුන්වන නම් ලියන්න. (ලකුණු 05)

i. අක්ෂාංශ $0^0$  ii. උතුරු අක්ෂාංශ $23\frac{1}{2}^0$  iii. දකුණු අක්ෂාංශ $66\frac{1}{2}^0$

05. i. පහත A හා B අක්ෂරවලින් දැක්වෙන භූ දර්ශන දෙක හැඳිනගෙන නම් කරන්න. (ලකුණු 02)



A



B

ii. (a) A භූ දර්ශනය හඳුනාගත හැකි දකුණු ආසියාවේ ප්‍රදේශයක් නම් කරන්න.


(b) එම භූ දර්ශනයේ කැපී පෙනෙන ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 04)

iii. (a) B අක්ෂරයෙන් දැක්වෙන භූ දර්ශනය හඳුනාගත හැකි ඉන්දියාවේ ප්‍රදේශ දෙකක් ලියන්න.

(b) B භූ දර්ශනය තුළ හඳුනාගත හැකි ගැටළු තුනක් ලියන්න. (ලකුණු 05)

06. i. සංචාරක ආකර්ෂණය දිනා ඇති ශ්‍රී ලංකාවේ පිහිටි වෙරළතීර දෙකක් ලියන්න. (ලකුණු 02)

ii. වෙරළ තීරයක විවිධ සංචාරක ආකර්ෂණ කිහිපයක් පහත රූප සටහනේ දක්වා ඇත. එහි A, B හා C අවස්ථා පිළිවෙලින් ලියන්න. (ලකුණු 03)





iii. (a) වෙරළ භූ දර්ශනය තුළ දැකගත හැකි සුවිශේෂී පරිසර පද්ධතියක් ලියන්න.

(b) වෙරළ පරිසර පද්ධතිය තුළ පැනනැගී ඇති පාරිසරික ගැටළු දෙකක් ලියන්න.

(c) වෙරළ පරිසර පද්ධතිය ආරක්ෂා කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් ලියන්න. (ලකුණු 05)

07. i. 1:50,000 භූ ලක්ෂණ සිතියම්වල හඳුනාගත හැකි භෞතික ලක්ෂණ හා සංස්කෘතික ලක්ෂණ දෙක බැගින් ලියන්න. (ලකුණු 02)

ii. ශ්‍රී ලංකාවේ දිග හා පළල දැක්වෙන පහත සිතියමේ A, B, C හා D පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 04)




iii. (a) සමෝච්ඡ රේඛා යනු මොනවාදැයි හඳුන්වන්න.

(b) ශ්‍රී ලංකාවේ 1:50,000 සිතියම්වල අඩංගු සමෝච්ඡ රේඛාවල විශේෂ ලක්ෂණ 2ක් ලියන්න. (ලකුණු 05)

08. දකුණු ආසියානු කලාපයේ විවිධ භූ දර්ශනවල තොරතුරු කිහිපයක් පහත දැක්වේ. මෙහි දැක්වෙන කොටු සටහන ඔබේ පිළිතුරු පත්‍රයේ පිටපත් කරගෙන ඒ ඒ භූ දර්ශනයට අදාළ නිවැරදි තොරතුරු එම කොටුව තුළ ලියා දක්වන්න. (ලකුණු 11)

1. තැනිතලා ප්‍රදේශයකි.
2. වී, තිරිඟු, උක් ප්‍රධාන වගාවන් වේ.
3. අඩු පහසුකම් සහිත ජනාවාස බහුලයි.
4. විවිධ උසින් යුතු කඳුවැටි ඇත.
5. රැළි බිම් ලක්ෂණ දැකගත හැකියි.
6. ජනාවාස බිහිවී ඇත්තේ වැඩ කේන්ද්‍ර කොටගෙනය.
7. වැලිපර කපොලු වැනි ලක්ෂණ දැකගත හැකියි.
8. අල වර්ග, මී පැණි, දඩයම් කළ සතුන් ආහාරයට ගනී.
9. හිම ක්‍රීඩාව හා සංචාරක කර්මාන්තය කැපී පෙනෙයි.
10. ප්‍රදේශය පුරා ව්‍යාප්ත වූ වාණිජ මධ්‍යස්ථාන රැසකි.
11. ශාක විශේෂ, උරග විශේෂ සහ පක්ෂි විශේෂවල විවිධත්වයක් ඇත.
12. කඳු, නෙරු, කපොලු දැකගත හැකියි.
13. භූගත ජලධරයක් ඇත.
14. ප්‍රධාන ආර්ථික කටයුත්ත කෘෂිකර්මාන්තය වේ.
15. හැඩපළු ගංගා, ගං දඟර, තැනිබිම් දැකගත හැකියි.

**දකුණු ආසියානු කලාපයේ භූ දර්ශන**

| නිම්න භූ දර්ශනය | කඳුකර භූ දර්ශනය | ග්‍රාමීය භූ දර්ශනය |
|---|---|---|
| 1. | 5. | 9. |
| 2. | 6. | 10. |
| 3. | 7. | 11. |
| 4. | 8. | |